# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION


සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1165/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 15/07/2024
පැය 1435

## මාධ්‍ය නිවේදනය

### 01. හෙරොයින් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.07.14 වන දින රාත්‍රී කාලයේ කොළඹ අපරාධ කොට්ඨාසයේ සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව, ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ද වාස් මාර්ගයේ සැක සහිත ලෙස ගමන් ගත් ත්‍රිරෝද රථයක් නවතා පරික්ෂා කිරීමේදී, එහි ගමන් කරමින් සිටි කාන්තාව හෙරොයින් ග්‍රෑම් 80 මිලි ග්‍රෑම් 100 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇති අතර එම කුලී ත්‍රිරෝද රථය පැදිකරු මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු හා සැකකරිය 39 හා 37 වයස් වල පසුවන බත්තරමුල්ල හා බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කොළඹ අපරාධ කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මෘත ශරීරයක් හමුවීම - උහන පොලිස් වසම.

2024.07.15 වන දින උදෑසන කාලයේ උහන පොලිස් වසමේ දෙමටමල්පැලැස්ස ප්‍රධාන ඇලෙහි පිරිමි මළ සිරුරක් පාවෙමින් ඇති බවට ලද පණිවිඩයක් මත උහන පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් පමණ වන අතර මරණකරුගේ අනන්‍යතාවය තහවුරු වී නොමැත.**
මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු අම්පාර රෝහලේ මෘතශරීරාගාරයට රැගෙන යාමට නියමිතයි. උහන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

### 03. බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොටවෙහෙර පොලිස් ස්ථානය.

2024.07.15 වන දින උදෑසන කාලයේ කොටවෙහෙර පොලිස් වසමේ නැබඩයාය ප්‍රදේශයේදී කොටවෙහෙර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන නැබඩයාය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොටවෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**